**මැදවච්චිය ප්‍රාදේශිය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 22 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මැදවච්චිය ප්‍රාදේශිය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු පිළිබඳව හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදු වී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | අඩුපාඩුවේ ස්වභාවය | විෂයයන් ගණන | මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම | | |
|---|---|---|---|---|---|
| | | | ආදායම් | වියදම් | වගකීම් |
| | | | රු.000 | රු.000 | රු.000 |
| (අ). | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 04 | 768 | - | - |
| (ආ). | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 05 | - | 63 | - |
| (ඇ). | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 01 | - | 342 | - |
| | -එම- | 01 | - | - | 342 |

#### 1.3.2 නොසැසඳු ගිණුම්

ගිණුම් විෂය 10 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 16,410,463 ක් වූ අතර, උපයෝගි ලේඛන/ වාර්තා අනුව එම ශේෂය රු. 11,957,668 ක් විය.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 ක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 556,384 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 411,494 ක ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | (i). 115 | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.216,888 ක භාණ්ඩ සම්බන්ධයෙන් තොග සහතිකයක් නොමැතිව ගෙවීම් කර තිබුණි. |
| | (ii). 163 | වර්ෂයේ ආදායම ගණනය කිරීම සඳහා සාරාංශ ආදායම් ලේඛණය (ප්‍රා.ස.19) සකස් කර විගණනයට ඉදිරිපත් නොවුණි. |
| | (iii). 180 | ලේකම් වරයා විසින් ඇප තබා නොතිබුණි. |
| (ආ). | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) | 2009 වර්ෂයේදී දෙන ලද රු.55,000 ක අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 වන විටත් පියවා තිබුණි. |
| (ඇ). | ආයතන සංග්‍රහය viii පරිච්ඡේදයේ 9.6 වගන්තිය | රජයේ නිවාඩු දිනයක රාජකාරියක් සඳහා ගමන් කිරීම නිවාඩු දින වැටුප් ගෙවීමේ කාර්ය සඳහා වැඩ කිරීමක් ලෙස |

| | | |
|---|---|---|
| | | ගණන් නොගත යුතු නමුත් එම ගමන් කළ කාලය සඳහා උ කාර්මික නිළධාරියකුට රු.11,500 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |
| (ඈ). | උතුරු මැද පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 1989 සැප්තැම්බර් 03 දිනැති අංක එල්ජ්/03 දරන චක්‍රලේඛය | පසුගිය වර්ෂ 03 ක බදුදීම් පදනම්ව තීරණය කරන අවම ලංසුව අවසාන වර්ෂයේ බදු දුන් මුදලට වඩා අඩුවේ නම් අවසාන වර්ෂයේ දුන් මුදල අවම ලංසුව ලෙස ගත යුතු වුවත් 2010 අවම ලංසුව තීරණය කිරීමේදී බදු ස්ථාන 04 ක අවම ලංසුව 2009 ට වඩා අඩු මුදලකට තීරණය කිරීම නිසා සභා අරමුදලට රු.467,150 ක පාඩුවක් සිදුවිය. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,433,832 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 311,692 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා , හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 ට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 ට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (අ) | වරිපනම් හා බදු | 877 | 301 | 1,138 | 206 | 169 | 37 |
| (ආ) | බදු කුලි | 2,487 | 1,236 | 601 | 2,257 | 972 | 1,285 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 600 | 797 | 491 | 550 | 565 | 0 |
| (ඈ) | වෙනත් ආදායම් | 460 | 1,692 | 3,439 | 2,500 | 100 | 2,400 |

#### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.1,686,269 ක් දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 වෙනත් ආදායම්.

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 122 සහ 152 වගන්ති අනුව ප්‍රචාරක දැන්වීම් වලින් , පෞද්ගලික උපකාරක පංති සහ නිතීඥ සේවා ආයතන වලින් බදු මුදල් අය කිරීමට වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 10,670 | 9,411 | 1,259 | 10,668 | 8,872 | 1,796 |
| අනෙකුත් | 3,071 | 2,547 | 524 | 5,954 | 4,583 | 1,371 |
| උප එකතුව | 13,741 | 11,958 | 1,783 | 16,622 | 13,455 | 3,167 |
| ප්‍රාග්ධන වියදම් | 8,194 | 11,371 | (3,177) | 2,602 | 12,799 | (10,197) |
| මුළු එකතුව | 21,935 | 23,329 | (1,394) | 19,224 | 26,254 | (7,030) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 01 | - |
| (ii) | ද්විතිය | 04 | 07 |

| | | | |
|---|---|---|---|
| (iii) | ප්‍රාථමික | 18 | 19 |
| (iv) | වෙනත් (අනියම්,තාවකාලික) | - | 04 |
| | එකතුව | 23 | 30 |

(ආ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාව විසින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා අනියම් සේවකයින් 04 ක් බඳවා ගෙන රු.907,200 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 නිෂ්ක්‍රීය භෞතික සම්පත්

උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී රු.814,000 ක උපකරණ ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණ නමුත් 2010 දෙසැම්බර් 31 වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබීම නිසා එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

### 2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.9,412,226 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,919,797 ක් විය.

### 2.5.3 අය විමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,284,706 ක්වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවිම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.227,506 ක් විය.

### 2.5.4 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම්වල අගය රු.266,584 ක් විය.

### 2.5.5 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු. 11,903,630 ක් විය.

**2.5.6 නොපියවූ අත්තිකාරම්**

**-------------------------**

2007 වර්ෂයේදී ගෙවා තිබුණු එකතුව රු.55,000 ක් වූ අග්‍රිම දෙකක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (5) විධිවිධාන පරිදි 2010 දෙසැම්බර් 31 වන විටත් පියවා නොතිබුණි.

**2.6 ආර්ථික නොවූ ගනුදෙනු**

**---------------------------**

2009 සැප්තැම්බර් මාසයේදී රු20,000 ක් වැය කර ස්ථාපිත කර තිබුණු අභ්‍යන්තර දුරකථන පද්ධතිය 2010 ජුලි 07 දින වන විට ක්‍රියාවිරහිතව පැවතුණි.

**2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**-----------------------------------------------------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව සභාවට අය විය යුතු යම් මුදල් ප්‍රමාණයක් අත්හැර දැම්ම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ජ'නල් අංක 15 මගින් රු.24,916 ක හිඟ මස්කඩ ආදායම් පොත්වලින් ඉවත් කර තිබුණි.

**2.8 කාර්ය සාධනය**

**------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුභසාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය,මංමාවත් හා පොදු උපයෝගි සේවාවන්ට අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා වූ ක්‍රියාකාර් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.9 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------**

**ඉදිකිරීම්**

**---------**

පහත සඳහන් කරුණු අනාවරණය විය.

**(අ).** මැදවච්චිය ගොවිජන සේවා මධ්‍යස්ථානය ඉදිරිපිට මාර්ගය බොරළු දමා A -9 මාර්ගයේ සිට මන්නාරම් මාර්ගය දක්වා සභා අරමුදල් යොදවා සංවර්ධනය කිරීම සඳහා රු.263,060 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. පළාත් ඉංජිනේරුවරයාගේ තත්ව පාලන වාර්තා අනුව මාර්ගය

තැලීම සහ ඝනකම සතුටුදායක නොවූ බැවින් ගෙවීම් කිරීමේදී රු.173,490 ක් පමණක් ගෙවීමට පලාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයා නිර්දේශ කර තිබුණි. කර්මාන්තය සඳහා මෙම මුදල පමණක් ගෙවා ඇතත්, ඉන්පසු නියමිත පරිදි වැඩ නිම කිරීමට කටයුතු නොකර අත්හැර දමා තිබුණු අතර ඉදිකිරීම් අසාර්ථක බව 2010 දෙසැම්බර් 03 දින කරන ලද භෞතික පරීක්ෂනයේදී නිරීක්ෂණය විය.

**(ආ).** උසාවිය ඉදිරිපිට කටුවෙල මාර්ගය මීටර් 800 ක් බොරළු යොදා සංවර්ධනය කිරීම සඳහා රු.303,646 ක ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර තිබුණි. පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් කරන ලද තත්ව පාලන පරීක්ෂණය අනුව බොරළු ඝනකම සහ තැලීම අසතුටුදායක වුවද ඇස්තමේන්තු වටිනාකම වූ රු.276,640 න් රු.202,480 ක් ගෙවා තිබුණි.

## 2.10 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය.

(ආ) ආදායම් පරිපාලනය.

(ඇ) වත්කම් කළමනාකරණය.

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය.